**State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning**

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper**

අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**History**

ඉතිහාසය

# (QUESTION PAPER) - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

**අ.පො.ස.(සා / පෙළ) විභාගය –2020**

**ආදර්ශ ප්‍රශ්න පත්‍රය I**

**ඉතිහාසය** **කාලය පැය 1යි**

<u>සැලකිය යුතුයි.</u>

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii),(iii),(iv) පිළිතුරු නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න**
- **ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසදෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

01. මහාවංශයෙහි අර්ථ විවරණය සඳහා රචනා කොට ඇති ටීකාව හඳුන්වන්නේ කුමන නමකින්ද?
    I. සමන්තපාසාදිකාව.
    II. සීහලට්ඨකථා මහාවංශය.
    III. වංසත්ථප්පකාසිනිය.
    IV. බෝධි වංශය.

02. ඉතිහාසය හැදෑරීමේ දී පුරා විද්‍යා මූලාශ්‍රයන් වැදගත් වන්නේ මින් කුමන හේතුව නිසා ද?
    I. ඓතිහාසික සිදුවීම් වලට වඩා පසුකාලීන වීම ය .
    II. විචාර බුද්ධියෙන් යුතුව පරිශීලනය කළ හැකි වීම ය.
    III. ඓතිහාසික සිදුවීම් වලට සමකාලීන වීම ය.
    IV. පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව වීම ය.

03. මෙරට ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු ගත හැකි ‘බටදොඹලෙන’ කුමන පරිසර කලාපයකට අයත්ද?
    I. කඳුකර වියළි අතර මැදි කලාපයට ය.
    II. පහතරට වියළි කලාපයට ය.
    III. තෙත් කලාපයට ය.
    IV. පහතරට අතර මැදි වියළි කලාපයට ය.

04. ඓතිහාසික බුන්දල වැල්ලෙගංගොඩ ප්‍රදේශයේ කැනීම් වලින් සොයා ගත් ගල්මෙවලම් සහිත බොරලු තට්ටුව අයත් කාල වකවානුව කුමක්ද?
    I. වසර 125000. II. වසර 38000. III. වසර 80000. IV. වසර 28000.

05. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ලක්ෂණයක් නො වන පිළිතුර වන්නේ,

I. පිළිස්සූ මැටිවළන් භාවිතය.
II. අක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කිරීම.
III. ලෝහ භාවිතය ආරම්භ කිරීම.
IV. ගම්වල ජීවත්වීම ආරම්භ කිරීම.

06. හෙලෝසීන යුගය නම් වූ අවධිය අයත් කාල පරිච්ඡේදය කුමක්ද?

1. ක්‍රි:පූ: 7000-4500. 2. ක්‍රි:පූ: 2000-4500. 3. ක්‍රි:පූ: 7000-5000. 4. ක්‍රි:පූ: 10000-7500.

07. මුල් ඓතිහාසික යුගයේ වඩුවන් විසූ ගම් හදුන්වන ලද්දේ,

I. කසීකාරගාම. II. මණිකාරගාම. III. කුම්භකාරගාම. IV. වඩ්ඩකීගාම.

08. දඹුල්ල කළුදියපොකුණ සෙල්ලිපියෙහි සදහන් වන්නේ,

I. දසගම් ඇත්තන් පත්කිරීම පිළිබදව ය.
II. ග්‍රාමසීමාවන් පිළිබදව ය.
III. බෞද්ධ විහාරයක දානමය ගැටලුවක් පිළිබදව ය.
IV. ගම් පාලනය පිළිබදව ය.

09. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස පසුකාලීනව ගංගා නිම්න තුලට අවතීර්ණය වූ ආකාරය පිළිබදව පෙන්වා දෙන්නේ,

| ‘අ’ | ‘ආ’ |
|---|---|
| 1. ප්‍රථමවරට අනුරාධපුරය පාලන මධ්‍යස්ථානය කිරීම. | A-භාතිකාභය රජතුමා. |
| 2. ශ්‍රී මහා බෝධි ශාඛා විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම. | B-දුටුගැමුණු රජතුමා. |
| 3. ප්‍රථමවරට දේශපාලන බලය මධ්‍ය ගත කිරීම. | C-පණ්ඩුකාභය රජතුමා. |
| 4. රෝමය සමග රාජ්‍යතාන්ත්‍රික සබදතා පැවැත්වීම. | D-දේවානම්පියතිස්ස රජතුමා. |

I. කලාඔය ගංගා නිම්නයේ පැරණි ජනාවාස අධ්‍යයනයෙනි.
II. වලවේ ගංගා නිම්නයේ පැරණි ජනාවාස අධ්‍යයනයෙනි.
III. කිරිදිඔය ගංගා නිම්නයේ පැරණි ජනාවාස අධ්‍යයනයෙනි.
IV. මල්වතුඔය ගංගා නිම්නයේ පැරණි ජනාවාස අධ්‍යයනයෙනි.

10. ‘වැව් ප්‍රපතනය’ සම්බන්ධයෙන් පහත සදහන් වන සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

I. වැවක අතිරික්ත ජලය පහත් භූමියක පිහිටිවැවකට රැගෙන යාම.
II. ඇළමාර්ග දෙපස භූමියේ තෙතමනය ආරක්ෂා කිරීම.
III. වැඩිවන ජනගහනයට සාපේක්ෂව බෝග වගාව පහසුවෙන් කළ හැකිවීම.
IV. මහවැව් සෑදීමට පදනමක් දැමීම.

11. ‘ආ’ තීරුවේ රජවරු ‘අ’ තීරුවේ සදහන් කාර්යයන් හා නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

I. CBDA II. CDBA III. DACB IV. CADB

12. පහත සඳහන් ඓතිහාසික අවස්ථා අතුරින් වසභ රජතුමා හා සම්බන්ධ සිදුවීම් පමණක් දක්වා ඇති පිළිතුර තෝරන්න.

A. ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය බවට පත්කිරීම.
B. මධ්‍යගත පාලනය ශක්තිමත් කිරීමට පාලන ඒකක පවත්වා ගැනීම.
C. රාජ්‍ය බදු අය කිරීම වඩාත් විධිමත්ව පවත්වා ගැනීම.
D. රුවන් වැලි සෑ දොරටු අසල දන්සැල් පැවැත්වීම.
E. ප්‍රථමවරට විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීම.
F. භික්ෂූන් වහන්සේගේ සිව්පසය උදෙසා දීමනා ලබාදීම.

I. ADEF II. ABDF III. BCFE IV. BCEF

13. වෙළෙඳාමේ සාර්ථකත්වය උදෙසා චීනය සමග රාජ්‍යතාන්ත්‍රික සබඳතා ගොඩනගාගත් රජතුමා වන්නේ,

| 'අ' | 'ආ' |
|---|---|
| i. මුතුගල සෙල්ලිපියේ zමජ්ජිමZ | A-කම්මල්කරුවෙකි . |
| ii. මණ්ඩාගල සෙල්ලිපියේ zතුලදරZ | B- ඇත්දත් ශිල්පියෙකි. |
| iii. වේගිරිය සෙල්ලිපියේ zසුමනZ | C-රන්කරුවෙකි. |
| iv. වෙහෙරකෙම සෙල්ලිපියේ zතතවයZ | D-නූල්කටින්නෙකි. |

I. පළමුවන ගජබාහු රජතුමා ය. II. හයවන අග්ගබෝධි රජතුමා ය.
III. පළමුවන විජයබාහු රජතුමා ය. IV. භාතිකාභය රජතුමා ය.

14. හේන් වගාව වෙනුවෙන් අයකළ කැතිඅඩ සහ කෙටුකනක බදු අහෝසි කළ රජතුමා වන්නේ,

I. නිශ්ශංකමල්ල රජතුමා ය. III. මහසෙන් රජතුමා ය.
III. හතරවන කාශ්‍යප රජතුමා ය. IV. පස්වන උයද රජතුමා ය.

15. 'අ' තීරුවේ සෙල්ලිපි හා 'ආ' තීරුවේ සඳහන් ශිල්පීන් නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

I. BADC II. ADBC III. BCAD IV. ACBD

16. ශ්‍රී ලංකාවේ පාලකයන් අන්තර් ජාතික වෙළෙඳ කටයුතු හොඳින් පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගත් බව සඳහන් කළ තැනැත්තා වන්නේ,

I. අරාබි ජාතික අල් බලසූරිය. II. ඉබ්න් ශහ්රියර්. III. ඉබන් බතුතාය. IV. හියුං සියෑං.

17. රජරට ශිෂ්ටාචාරයට අයත් බොහෝ කාව්‍යයන් හී තේමාව ලෝකයේ පවතින අනිත්‍ය ස්වාභාවයයි. එයට හේතුව ලෙස සැලකිය හැක්කේ,
    I. පන්සල් ආශ්‍රිතව අධ්‍යාපනය ව්‍යාප්තවීම ය.
    II. බුදු දහමින් ලද හික්මීමත් ස්වාභාව ධර්මය සමග කටයුතු කිරීමත් ය.
    III. ජාතක කතා පොතෙහි ආභාසය ලැබීම ය.
    IV. භික්ෂූන් වහන්සේ පමණක් කාව්‍යකරණයේ නිරතවීම ය.

18. සීගිරි ජල උද්‍යානයේ ජලමල් හතරක් නිර්මාණය කිරීමට හේතුව වන්නේ,
    I. ජලය ඉහළට එසවීමට පීඩනයක් අවශ්‍ය නිසා ය.
    II. සිදුරුවල විෂ්කම්භය වෙනස් කිරීමට ය.
    III. රොන්මඩ ගරුත්ව බලයෙන් පහළට කිදා බැසීමට ය.
    IV. ඉහළට නගින ජලකෙද්ද උසෙහි යම් වෙනසක් ඇතිකිරීමට ය.

19. දෙහිගහ ඇලකන්ද ප්‍රදේශයේ යකඩ නිස්සාරණ උඳුන දැල්වීම සිදුකර තිබෙන්නේ,
    I. මයිනහම ආධාරයෙනි. II. ස්වාභාවික සුළං භාවිතයෙනි.
    III. මරංගස් පිළිස්සීමෙන් ය. IV.යකඩමරං අගුරු යෙදීමෙන් ය.

20. 'අ' තීරුවේ සදහන් නියෝග හා 'ආ' තීරුවේ එම නියෝගය දුන් රජවරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| මිණී මැරීමට ද`ඩුවම එල්ලා මැරීම. | A- හතරවන උදය රජතුමා. |
| වෙළෙදාම් කරන අයගෙන් පමණක් බදු ගැනීම. | B- නිශ්ශංකමල්ල රජතුමා. |
| කිසිඳු සතෙකු නොමැරිය යුතුය. | C- හතරවන මිහිඳු රජතුමා. |
| වාරි ජල භාත කඹුරුවල මුං ඇට වැපිරීම නොකළ යුතුය. | D- ආමණ්ඩ ගාමිණී අභය රජතුමා. |

I. BADC  II. CACB  III. CDBA  IV. CADC

21. අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා සහ පොළොන්නරුව අගනුවර බවට පත්කර ගත් රජවරු නිවැරදිව සදහන් පිළිතුර තෝරන්න.
    I. පස්වන මිහිඳු රජතුමා, පළවන පරාක්‍රමබාහු රජතුමා.
    II. පස්වන මිහිඳු රජතුමා , පළවන විජයබාහු රජතුමා.
    III. හතරවන කාශ්‍යප රජතුමා , හතරවන මිහිඳු රජතුමා.
    IV. පළවන විජයබාහු රජතුමා , හතරවන කාශ්‍යප රජතුමා.

22. කුරුණෑගල රාජ්‍ය සමයෙහි දෙවන භුවනෙකබාහු රජතුමාට පසුව රාජ්‍යත්වයට පත් වන්නේ,

I. හතරවන පරාක්‍රමබාහු රජතුමා ය. II. තුන්වන භුවනෙකබාහු රජතුමා ය.
III. පළවන පරාක්‍රමබාහු රජතුමා ය. IV. තෙවන වික්‍රමබාහු රජතුමා ය.

23. ගාල්ලේ ත්‍රිභාෂා ලිපිය පිහිටුවන ලද්දේ,

I. 1411 II. 1405 III. 1505 IV. 1409

24. පහත සඳහන් කරුණු අතරින් කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජතුමා විසින් ඉටුකළ සේවාවන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A. වන්නිප්‍රදේශය යටත් කර ගැනීම.
B. ජෝතිය සිටාණන්ගේ කැරල්ල පරාජය කිරීම.
C. අම්බුළුගල කුමාරයා ලවා යාපනය යටත් කර ගැනීම.
D. රට එක්සේසත් කිරීම.
E. අධ්‍යාපනයට සාහිත්‍යයට රාජ්‍ය අනුග්‍රහය දීම.

I. BCDE II. ABCE III. ABDE IV. ACDE

25.පහත සඳහන් කරුණු අනුව ප්‍රකාශිත රජතුමා කවුද?

අ. විමලධර්මසූරිය රජුගේ ඥාති සොහොයුරෙකු වීම.
ආ. උඩරට රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීමේ අභියෝගය ජයගැනීම.
ඇ. පෘතුගීසි තර්ජන අවම කර ගැනීමට සමත්වීම.
ඈ. දෝන කතිරිනා විවහා කර ගැනීම.
ඉ. උඩරට රාජ්‍ය කොටස් තුනකට බෙදා කුමාරවරුන්ට පවරාදීම.

I. දෙවන රාජසිංහ රජතුමා. II. සෙනරත් රජතුමා.
III. දෙවන විමලධර්මසූරිය රජතුමා. IV. පළවන විමලධර්මසූරිය රජතුමා.

26. යුරෝපා පුනරුද සමයේ කලා ශිල්ප කේෂත්‍රයේ ඇති වූ වෙනස්කම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

අ. කලා ශිල්පීන් ශ්‍රේණි වශයෙන් සවිංධානය සිටීම.
ආ. ලෞකික රස වින්දනය අගයන ධනවතුන්ගේ අනුග්‍රහය.
ඇ. කලා ශිල්පීන්ගේ නමින් නිර්මාණ එළිදැක්වීම.
ඈ. කලා නිර්මාණ ආගමික නැඹුරුවක් ගැනීම.
ඉ. ස්වාධීන දක්ෂතා මතු කරමින් නිර්මාණ බිහිවීම.

I. ඇ ,ඈ .ඉ. II. අ ,ඈ ඉ. III. ආ ,ඉ .ඈ IV. ඉ ,ආ , ඇ

27. ලන්දේසීන් ලිපි ගනුදෙනු වලදී “ඔබ වහන්සේගේ සුවච කීකරු සේවක” වැනි පද භාවිත කළේ කුමන රජතුමා වෙනුවෙන්ද?

I. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා. II. දෙවන රාජසිංහ රජතුමා.

III. රාජාධිරාජසිංහ රජතුමා. IV. ශ්‍රී විජය රාජසිංහ රජතුමා.

28. ‘අ’ තීරුවේ සදහන් ඉංග්‍රීසි නියෝජිතයින් හා ‘ආ’ තීරුවේ එම නියෝජිතයින් ධූත සබදතා පැවැත් වූ රජවරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ‘අ’ | ‘ආ’ |
|---|---|
| 1. ජෝන් ෆයිබස්. | අ. රාජාධිරාජසිංහ රජතුමා. |
| 2. හියුබොයිඩ්. | ආ. දෙවන විමලධර්මසූරිය රජතුමා. |
| 3. රොබට් ඇන්ඩෲස්. | ඇ. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා. |
| 4. මැක්ඩෝවල් සෙනෙවියා. | ඈ. දෙවන රාජසිංහ රජතුමා. |
| | ඉ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා. |

I. ඈ, අ, අ, ඉ. II. අ, ආ, ඉ, ඈ III. ඈ, ඉ, අ, අ. IV. ඉ, ඈ, ආ, අ.

29. කාර්මික විප්ලවයට සමගාමීව ප්‍රවර්ධනය වූ කෘෂි කාර්මික විප්ලවයේ ලක්ෂණයන් නො වන පිළිතුර තෝරන්න.

අ. කෘෂි කර්මය වෙළෙඳාම අරමුණු කර ගැනීම.

ආ. මහා පරිමාන ගොවිබිම් ඇතිවීම.

ඇ. පෞද්ගලික කුඩා ගොවි ඉඩම් පරිහරණයට සීමාවීම.

ඈ. ශෂ්‍යමාරු ක්‍රමය හා කට්ටි මාරු ක්‍රමය ඇරඹීම.

ඉ. ගුවානෝ පොහොර විශේෂය සොයා ගැනීම.

ඊ. මිනිස් ශ්‍රමයට ප්‍රමුඛත්වය දීම.

I. අ, ඊ. II. ආ, ඉ. III. ආ, ඈ IV. ඇ, ඊ.

30. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයෙහි 1818 සටනින් අනතුරුව ‘ඉංග්‍රීසි ප්‍රකාශනය’ නිකුත් කළ ආණ්ඩුකාරවරයා කවුද?

I. තෝමස් මේඩ්ලන්ඩ් ආණ්ඩුකාරවරයා. II. රොබඩ් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා.

III. සර් පෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා. IV. ටොරින්ටන්සාමි ආණ්ඩුකාරවරයා.

31. දමිළ සිසුන්ට හින්දු සංස්කෘතියට ගැලපෙන අධ්‍යාපනයක් ලබාදීම සඳහා ‘වන්නපොනෙයි ශෛව ප්‍රකාශ විද්‍යාලය’ පිහිටුවීමට පුරෝගාමී වූයේ,

I. ආරුමුග නාවලර්තුමා ය. II. පොන්නම්බලම් රාමනාදන්තුමා ය.

III. පොන්නම්බලම් අරුණාචලම්තුමා ය. IV. පී. සුන්දරම්තුමා ය.

32. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් පත්කරන ලද්දේ කුමන පාර්ශවයක් විසින්ද?

I. අග්‍රවිනිශ්චයකාරවරයා විසින් ය. II. අග්‍රාණ්ඩුකාරවරයා විසින් ය.
III. අධිකරණසේවා කොමිෂම විසින් ය. IV. අග්‍රාමාත්‍යවරයා විසින් ය.

33. 1972 ආණ්ඩුක්‍රමය යටතේ අධිකරණ පද්ධතියෙහි 'අපරාධ නඩු' විනිශ්චය කිරීමට පවරා තිබුණේ කවර අධිකරණ ආයතනයකටද?

I. මහෙස්ත්‍රාත් අධිකරණවලට ය. II. දිසා අධිකරණවලට ය.
III. පළාත් අධිකරණවලට ය. IV. ප්‍රාථමික අධිකරණවලට ය.

34. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව "මූලික අයිතිවාසිකම්" විග්‍රහ කරන්නේ කුමන වගන්තිය යටතේද?

I. තෙවන පරිච්ඡේදය යටතේ ය. II. අටවන වගන්තිය යටතේය.
III. හත්වන පරිච්ඡේදය යටතේ ය. IV. 129 වැනි වගන්තිය යටතේය.

35. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව අනුව ප්‍රථමවරට ජනමත විචාරණයක් පවත්වන්නේ කිනම් වර්ෂයේදී ද?

I. 1989 II. 1982 III. 1994 IV. 2005

36. මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ කොත්මලේ, වික්ටෝරියා සහ රන්දෙනිගල ව්‍යාපාර සඳහා මූල්‍යාධාර සැපයූ රටවල් පිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.

I. බටහිර ජර්මනිය, ස්විඩන්, බ්‍රිතාන්‍ය. II. බ්‍රිතාන්‍ය, ස්විඩන්, බටහිර ජර්මනිය.
III. ස්විඩන්, බ්‍රිතාන්‍ය, නෝර්වේ. IV. ස්විඩන්, බ්‍රිතාන්‍ය, බටහිර ජර්මනිය.

37. නිදහසෙන් පසුව රජය සතු ඉඩම් කලමනාකරණයට පිහිට වූ ආයතන'අ' තීරුවේ ද, එම ආයතන පිහිට වූ වර්ෂ 'ආ' තීරුවේ ද ස`දහන්ය.'අ' සහ 'ආ' නිවැරදිව ගැලපූ විට ලැබෙන

| 'අ' | 'ආ' |
|---|---|
| රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීම. | අ. 1958 |
| උඩරට වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවීම. | ආ. 1976 |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවීම. | ඇ. 1978 |
| | ඈ. 1983 |

පිළිතුර තෝරන්න.

I. අ, ආ, ආ. II. අ, ඇ, ආ. III. ආ, ඇ, අ. IV. ඇ, අ, ආ.

38. පළමුවන ලෝක යුද්ධයට සම්බන්ධ වූ මිත්‍ර පිලේ රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

I. ජර්මනිය, ඔස්ට්‍රියාව, තුර්කිය, හංගේරියාව.

II. තුර්කිය, ප්‍රංශය, ඉතාලිය, රුසියාව.

III. ප්‍රංශය, මහා බ්‍රිතාන්‍ය, රුසියාව, ඇමරිකාව.

IV. රුසියාව, ප්‍රංශය, ඔස්ට්‍රියාව, මහා බ්‍රිතාන්‍ය.

39. දෙවන ලෝක යුද්ධයේ දී ජපානය කොළඹට බෝම්බ හෙළන ලද්දේ ,

I. 1942 අප්‍රේල් 05 දිනය.
II. 1942 අගෝස්තු 09 දිනය.
III. 1942 අප්‍රේල් 07 දිනය.
IV. 1942 අගෝස්තු 10 දිනය.

40. එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාෂය තෝරන්න.

I. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන අධිකරණය ජාත්‍යන්තර අධිකරණය වේ.

II. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලන කාර්යාලය මහලේකම් කාර්යාලය යි.

III. ආර්ථික හා සමාජ මණ්ඩල සාමාජික සංඛ්‍යාව 56කි.

IV. වර්තමානයේ භාරකාර මණ්ඩලය අක්‍රීයව පවතී.